# කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

රජය සතු පූර්ණ සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී - General Manager

### (ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය-HM-2-1)

පුරප්පාඩු පවතින ස්ථානය – පුල්මුඩේ යන්ත්‍රාගාරය – පුරප්පාඩු 01

(අවස්ථානුකූලව ප්‍රධාන කාර්යාලයේ හා පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය කළ යුතු වේ.)

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම. **සමග**

මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය/ ගණකාධිකරණය ක්ෂේත්‍රන්ට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. **සහ**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 18 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.) **හෝ**

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය/ ගණකාධිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම. **සමග**

මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකරණය පිළිබඳ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම. **සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. **සමග**

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාව.

HM-2-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය: HM-2-1, රු. 91,645/= =2,700X12 = 124,045/= රු. 91,645/= වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව** – අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

පොදුවේ ගෙවනු ලබන දීමනාවන්ට අමතරව HM-2-1 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් දීමනාද හිමිවේ.

**දීමනා**

1. PED/1/2015,PED/1/2015(i) හා PED/1/2015(ii) යන චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන දීමනාව හෝ රාජකාරී කටයුතු සඳහා ආයතනයේ වාහනයක් යන දෙකෙන් එකක් ලබාදීම.
2. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම.
3. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රීය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ Vii පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**ගෙවනු ලබන වැටුපට අමතරව පහත සඳහන් දීමනා හා ප්‍රතිලාභ ද හිමිවේ.**

**පොදු දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7,800/= ක් වන ජීවන වියදම් දීමනාව.
02. මාසික ආහාර දීමනාව – දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරි දීමනාව – දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු. 4,000/= දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)

**ප්‍රතිලාභ**

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල්ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    - i. වසරක් සඳහා රු. 200,000/= ක රෝහල්ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    - ii. වසරක් සඳහා රු. 20,000/= ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණ (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    - iii. වසරක් සඳහා රු. 5,000/= දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණ (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම
    - i. වසරකට වරක් රු. 5,000/= ක දීමනාව (සාමාන්‍ය වෛද්‍ය ගාස්තු සඳහා)
    - ii. වසර දෙකකට වරක් රු.12,000/= ක දීමනාව (විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්නාඩි හා ශ්‍රවණාධාර වියදම්)
    - iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු. 12,000/=
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. තෝරාගනු ලබන අයදුම්කරුගේ මුළු ඉපයීම්වලින් උපයන විට ගෙවීමේ බද්ද (Pay as You Earn Pay Tax) අය කර ගනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන අයදුම්පත් (අදාළ සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත්ද සමග) ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරියේ සරණ මාවතේ අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2022 අගෝස්තු මස 22 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුවේ.

**සභාපති, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක 341/21, සරණ මාවත, රාජගිරිය.**